# සීතාවක ප්‍රාදේශීය සභාව
## 2018 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම.

සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ඒ. චන්දන පද්මසිරි වන මම 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කිය විය යුතු එම පනතේ 152 (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු නියම කිරිම පහත සදහන් ආකාරයට විය යුතු බවට2017 /10/12 දින අංක 9258 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2017 /10/12 දින,
සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී,

කේ.ඒ.චන්දන පද්මසිරි,
ලේකම් හා බලතල,කාර්ය,කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වැනි වගන්තිය සමග ක්යවිය යුතු 152 වන උප වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සීතාවක ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2018 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2017 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2018 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

### ඉහත කී උප ලේඛනය.

| විෂය අංකය | 1 වන තීරුව<br>2017 වර්ෂයේදි ව්‍යාපාරයේ ආදායම | 11 වන තීරුව<br>රු. ශත. |
|---|---|---|
| 1 | රු. 6000 නොඉක්මවන | කිසිවක් නැත |
| 2 | රු. 6000 ඉක්මවන එහෙත් රු.12000 නොඉක්මවන අවස්ථාවක | රු.90.00 |
| 3 | රු.12000 ඉක්මවනනමුත් රු.18750 නොඉක්මවන විට | රු.180.00 |
| 4 | රු.18750 ඉක්මවන රු.75000 නොඉක්මවන විට | රු.360.00 |
| 5 | රු.75000 ඉක්මවන නමුත් රු. 150000 නොඉක්මවන විට | රු.1200.00 |
| 6 | රු. 150000 ඉක්මවන විට | රු.3000.00 |

සිංහල, දෙමළ හා ඉංග්‍රිසිමාධ්‍යය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂා වලින් පළ කිරීමේදි යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.